# නිර්මාණ Nirmana





## එක කොඩියේ සෙවනේ

ස ම සි ත් ඇතිවැ එකමුතුකම වෙන්න දැඩී
බැ ඳ අ ත් වැල් සාමයෙන් එක්වන්න රෙඩී
කොතනත් එකම රට ඉඩ නැත යන්න කැඩී
උ තු රෙ ත් සිංහ කොඩි දකුණෙත් සිංහ කොඩී

ඔබටත් දකුණ වාගෙම අපටත් උතුර
කවදත් උරුමයක් බව සලකනු මිතුර
සිරිලක් ගෙට තිබෙන දොරටුවෙ එක යතුර
සමතත් වයෙ තැබුම පාලනයෙහි සුතුර

ත ම අයිතියක් කිය කිය යුද බිමක ගැටී
අ ම තක කළ නොහේ මිනිසුන් මැරුව හැටී
බි ම හොට ඇනී ඇති මොහොතක හරහ වැටී
මෙම පාඩම ඉගෙන ගත්තොත් හොඳය කොටී

ළ ඳු දිය අගල් වනපෙත් හැම එක කිම්ම
රු දු කොටි වෙඩිඋණ්ඩ මැද ගොස් නොබි යෙම්ම
පොදු මහජනතාව සහ රට වෙනු වෙම්ම
පු දු මයි සෙබළ දූ පුතුනගෙ බැඳි බැම්ම

මු ලු ගැහි ගැහි සිටියෙ බියගුළු හැඟුමෙන් ය
ක ලු කොටි මුහුදු කොටි වනකොටි වසයෙන් ය
ප ලු පලු යන්න බැටදුන් රණ විරුවන් ය
බැලූ විට කොටි නොවේ සේරම හිවලුන් ය

ත ම තම පෙළපතට නිවහල් ගතිය පිට
ස ම ගිව ජාති බේදයකින් තොරව සිට
කිම ඉන්නට නොහැකි නැවිත් බෙදුම කට
හැම ටම හෙවන ඇත එක සිහ කොඩිය යට

♦ **කිවිපති පාතකඩ කුලතිලක**
Maharagama **Sri Lanka**

## රස වෑහෙන දෙමළ ප්‍රස්ථාව පිරුළු

***දෙමළ භාෂාවේ සිංහළ භාෂාවේ මෙන්ම ඉතා රසවත් යෙදුම් උපමා සහ ප්‍රස්ථාව පිරුළු අප්‍රමාණය. මේ කවි පෙළට පාදකව ඇත්තේ ඒ ප්‍රස්ථාව පිරුළු කීපයකි. දෙමළ බස හදාරන්නටයයි ආන්දෝලනයක් ඇතිවී තිබෙන මෙ කල මෙවැනි යෙදුම් දැන සිටීම අපේ බස පෝෂණය වීමට ද ඉවහල් වේ.***

බූරුව රජෙකි අසු නැති ගම් පළාත ට
අලි දහලයිද හෙණ්ඩුව නැති වෙලාව ට
යගදාවක් මොටද කුකුළෙකු මැරීම ට
ඇහැකිද බල්ලාට නිහඬව සිටීම ට

සෙක්කුව කරකවන්නේ ගම් වැසියන් ය
තෙල් ඔක්කෝම ගෙනයන්නේ වෙළඳුන් ය
දොස් ඇති නැවට නව දෙනෙකුම කපිතන් ය
හොඳ මුත් හෙවණ නරකය නම් දිමියන් ය

සෙල්ලම් පෙන්නුවත් නැගගෙන කණුව මත
බැහැලා බිමට හිඟමන් ගත යුතුව ඇත
විඳිනට සුවඳ මල පොඩිකළ යුතුම නැත
එක ඇටයකින් දැනගත හැක හැළියෙ බත

නැකම මස්සිනේ අක්කා සිටින තුරුයි
තිබුණත් සිසිල් සඳ ලොව ඉල්ලන්නෙ හිරුයි
ඇඟිලි පහම පස් විදියකි කනට හුරුයි
ලැව් ගින්නට සඳුන් පමණක් රැකෙනු බොරුයි

පරදිනු නැතිය එළුවෙකු හට මහළු කොටී
ගිනිබත් වූ ගෙයක අඩු නැත අඟුරු කැටී
නැත්තෙද ගසේ ගෙඩි ඒ ගස මුලට වැටී
ලුණු කන්නාය දිය බොන්නේ ලොවේ හැටී

ඉනිමග තල්ලුකර අටුවට නගිනු කෙසේ
වඳුරෙක් කෙසෙල් ගෙඩි නොකනා දකිනු කෙසේ
තිබුණට පුරුක් උක් අමිහිරි වන්නෙ කෙසේ
වේදය ජපකරන කෝවිල දන්නෙ කෙසේ

එක බොරුවකට බොරු නවයක් රැදෙයි මුවේ
මිතුදම දුරින් නම් දෙහිතට දැනෙයි සුවේ
නැත පරදින්නෙ අලි කොටිනට ළඳුන් ලොවේ
අත මත පෙට්ටි ඇති ඔක්කොම වෙදුන් නොවේ

වැව මුර කරන්නා ඉන් දිය නොබොන් නෙද
ගිනිගත් ගෙයක් නිවනට ළිං කපන් නෙද
බළලෙකු හට දෙන්න ගිරවෙක් හදන් නෙද
දෙදෙනෙක් කෙසේ නම් රහසක් රකින් නෙද?

♦ **ගම්පහ - ෆිලික්ස් ඩී. ප්‍රනාන්දු**
**යක්කල Sri Lanka**

## දනන් සිත් සොම්නස් වෙත්වා!

නීතියයි සාමයයි රැකුණොත් රටේ දියුණුව ලැබෙනවා මය
භීතියයි සාපයයි වැඩුණොත් අපේකම හෙට නැසෙනවා මය
ගීතයයි සාහිතෙයි පැදියයි සරිකළොත් රට හැදෙනවා මය
වාතයයි ජලයයි ලෙසින් මහ බලකඳක් වී නැගෙනවා මය

උතුරු කරයේ රුදුරු රණගොස කිසිම විට යළි මතු නොවේවා
සතුරු කරදර මිතුරු බලයෙන් නැසී සත සෙත නිති සැදේවා
පැතුරු සෙනෙහස අතුරු නොමැතිව මනස් මැදුරේ විසිර යේවා
ඇතුරු මල් වියනක් ලෙසින් රටවැසි දනන් සිත් තුටු කෙරේවා!

♦ **ඩී. එන්. එම්. ආරච්චිගේ** **Sri Lanka**

## සිරි දළදාවයි මහනුවරයි

කඳු පෙළ නීල තුරු ලිය නල වැල් ඔස්සේ
ගුවනත වළා සුදු ඇඳ පහළට බැස්සේ
කඳුරට තෙමාලූ බුදුගුණ මල් වැස්සේ
පුදනට මුණිඳු දා හිමි සමිඳුන් රිස්සේ

නිල් දිය සළුව ඇඳ පේවේ වැව් කුමරී
සිල් ගත් විහග කැල තුඩ බුදු ගී මිහිරී
මල් මල් බැලූ බැලූ දස අතු මත ඉහිරී
දල්වන පහන් දිලි දිලි එළි පුර පැතිරී

පුරවර අසිරි සෙංකඩගල මහ නුවර
පෙරහැර හෙළ කලා පසතුරු ගොස මධුර
සුර පුර සදිසි මිහිබට ලෝ දන පවර
සිරිබර මැදුර දෙවොලින් වට දා මැදුර

වරුණා පුරාණය ඉතිහස සිතට නැගේ
පිපුණා හදේ දැය අබිමන් සොඳුරු යුගේ
රිදුණා සතුරු උවදුරු පරගැතිය නගේ
මිදුණා ලබා නිදහස ලක්මැණී මගේ

♦ ***එම්. කේ. තම්මිට Sri Lanka***

## සිඳ දැමූ බෝ රුක

***නිමිත්ත - කොළඹ බොරැල්ලේ පැරණි බෝගස කපා දැමූ දා***

ජයසිරි මා සමිඳු පෙළපත බැඳුණු නමින්
සියවස් ගණන් අභිමානෙන් පැවත එමින්
පුද නොලැබුවද මල් පහනින් සුවඳ දුමින්
රුක් රද වැජඹුණා අපහට සෙවන දෙමින්

නෙත සිසිලස සදන නිල් බෝපත් රැනයි
දස අත සෙවන දුන් ශාඛා සිය ගානයි
නිවහන් තැනූ සියොතුන්ගේ රජ දානයි
මේ හැම දෙයම සිඳ බිඳ දා අව සානයි

සැඩ හිරු රැසින් උණුසුම දාහයද ගෙනේ
තිර රෙදි මුදා ලැබුමට බැහැ සිහිල් ගුණේ
බෝපත් සළුව ගිලිහී ගොස් නැතිව සෙනේ
කවුළුව තුළින් නිරුවත් වුණු අහස පෙනේ

නිලදරු පිරිසකට පහසුව සදමු කියා
නව මහ මැදුරකට ඉඩකඩ ලබන නියා
දුන් අවසරෙන් හැම නෙත් අග කඳුළු තියා
රුක් රජ අනේ අද අවසන් ගමන් ගියා

බුදුවෙන මොහොත දුන් සෙවනට කළ ගුණය
අනිමිස ලෝචනෙන් පුද කළ බුදු ගුණය
අමතක කළත් මිනිසුන් පිරි අව ගුණය
රුක් රජ කමනු මැන! පා ඔබ මෙත් ගුණය

♦ **තිලකා ධර්මදාස**
**බත්තරමුල්ල Sri Lanka**



## හෙට දවස

විසිරුණා සඳ කිරණ
වැළපුනා ගස් වැල්
කැළඹුණා කඳු මුදුන
ඉගිළුණා වවුලන්

මල් කහට කෝප්පය අතේ අරන්
දොර මුලට වෙලා මහ සිටි බලන්
සිත කීරිගැහෙන දරු පෙම නාමෙන්
මව්වරු බුදුවේවා! සිය දහසින්

දළුදමන ගිනි බටය තුරුළුකරන්
තල් වැටේ මැවෙන රුව ඇගේ පුතුන්
හෙට දිනක අරුණෝදෙ ඉගිල ගොසින්
සුදු පරෙවි රැළක් මතුවෙලා වරෙන්

♦ **වික්‍රම්ප්‍රිය පෙරේරා USA**

## පින් රැස්කඳ පතුරවන්න!

පින නැතුවා මුනි පැවසූ දිවමන් බුදු බණ අහන්න
පින ලැබුණා දම් පහසින් පේවුණු දළදා වඳින්න
හිතේ පිපුණු බැතිමල් ගෙන සිරි දළදා හිමි පුදන්න
අපි යනවා උඩ මලුවට ඔබත් එන්න පින් ලබන්න

සෙංකඩගල පුරෙන් ඇසෙන සාදු නාද හඬ අසන්න
දෙව්ලොව සිට දෙවියොත් එති දළදා වැඳ පින් ලබන්න
මේ ලක්බිම සතර අතින් පව්කම් සෝදා හරින්න
දළදා සමිඳුනේ රටට පින් රැස් කඳ පතුරු වන්න

♦ ***දයා ඩී. පොන්සේකා*** **Sri Lanka**

## කාලය එළඹ ඇත

අතහැර දමා බල ලෝබය කසළ ගොඩ
ජීවන ගමන අප හැමගේ කරමු හැඩ
රට දැය සමය වෙනුවෙන් අපි කරමු වැඩ
යුද ගිනි යළිත් එන්නට නම් නොදෙමු ඉඩ

සාමය සතුට සැනසුම සුණු විසුණු කොට
අපි ගත කළා මහ ගින්දර ගොඩක් යට
දැන් හැක එකාමෙන් අප හට සිටින් නට
කාලය එළඹ ඇත දොරටුව විවර කොට

♦ ***එස්. කංකානම්ගේ*** **London SE5**

## විපතෙන් සැපතට

ගල්වුණ කලට මුතු බෙල්ලාගේ කඳුළ
අගනා දෙයක් වෙයි මුළු ලෝ තුළ පතල
යොදවනු හැකිවිනම් අපගේ නෙත් කඳුළ
වටිනා දේ මවන්නට ලෝ තුළ සකළ

ලත් පාඩම් වලින් නැණ ගුණ තියුණු කොට
දුක හරවන්න පුළුවන් නම් සතුට කට
මිහිපිට ඔබයි සැනසෙන දන ලැබ සතුට
එනයින් පිරෙයි ලොව තුළ සාමය සතුට

වින්දොත් දුකක් සැප අත ළඟ බව ඇත්ත
ලෝ දම එයයි දහිරිය මය විය යුත්ත
නොම කලකිරී මන හා දැඩිකර චිත්ත
නොබිඹියව ඇති දෙයට පිවිසීමයි යුත්ත

දුක සැප හොඳ නරක හා ලාබා ලාබ
කාටත් පොදුයි නැත උස් මිටිකම් ලාබ
සිත දැඩි කළොත් අදිටන් බලයෙන්ම ඔබ
හැමදා දිලෙයි නැත වියැලී හද අරඹ

මුතු බෙල්ලන්ව හඬවා වැගිරෙන කඳුලෙන්
ලද මුතු පළඳින්නෙ බෙල්ලන් නොව මිනිසුන්
කඳුළින් අපේ අපටම මුතු ඇට මවමින්
ජය ගත හැකිය අපහට අප දිවි සටනින්

♦ ***මධුරි අබේවික්‍රම*** **Harrow UK**

## මිතුරු ගිරා

***ආදරය නිසා නිවාස අඩස්සියට පත් දැරියක වෙනුවෙනි.***

කෝල බැලුම් හෙලමින් තුරු හිසේ සිට
මිහිරි නදින් ගී ගැයුවත් විටින් විට
සුවඳ විළඳ වළඳන්නට හොටින් හොට
සිපිරි ගෙයින් පිටවන්නට නොහැක මට

කූඩුකරන් මුර දමමින් ළඟින් හිඳ
ගගන සරමි ඔබ හා සිහිනයන් මැද
දිනක ඇරන් කූඩුවෙ දොර පියන් බඳ
තරණය කරමු නිලඹර අපි මිතුරු සඳ

අත්තටු සවිය ඇත්නම් කිමද කාරණ
හිත්තුටු නොවී ඉන්නද සිතැඟි පාරන
මත්තට කුමක් වූවත් බිඳිමු වාරණ
අත්විඳ ගනිමු දෙහදක සුහද තීරණ

මිතුරු ගිරා එනතුරු මග බලන් නම්
මල් ගොමුවක සුව යහනක් සදන් නම්
හොටින් තිරිඟු ඇට එක එක කවන් නම්
දැල නීල ආකාසය සරන් නම්

සුළං කෝඩ මැද සැක බිය නැතිව ඉමූ
හිරු කිරණින් වෙර වීරිය සිතට ගමූ
සඳ එළියෙන් ඇල් පවනින් සිහිල වෙමූ
හිතේ සුවය ගස් වැල් මල් වලට දෙමූ

♦ ***පද්මා කුරුප්පු*** **Paris, France**

## රන්මිණි රැස්

කළිඟු පුරෙන් හෙළදිව වැඩි දළදා
පෙළහර පා රුපු බල බිඳි දළදා
දෙව් බඹ සුර නර නමදින දළදා
ලක් දෙරණට සරණයි සිරි දළදා

දන්ත කුමරු සමගින් හිමි දළදා
හේමමාලි වැඩමෙව් සිරි දළදා
රන් සියපත් මත සැතපෙන දළදා
පින්කෙත අපි නමදිමු සිරි දළදා

සෙංකඩගල පුරවරයෙහි නිබඳා
රන් මිණි රැස් පතුරන මුනි දළදා
කැන්දන සග සුව තුන් සිත පහදා
තුන් හෙළයට සරණයි සිරි දළදා

♦ ***පියසීලි ගුණසේකර සුමනරත්න***
හොරණ **Sri Lanka**

## ලතෝනිය

**රළු සුළඟ වැළපෙනා හඬ**
**දුක වැඩිය ගීයකට දුක්බර**
**වළාකුළු බුම්මා හිඳින කල**
**නංවයි අසුබ ඝණ්ඨා හඬ**
**සැඩ සුළඟ දිගු රැ කල**

**නොවටිනා කඳුලැති**
**කුණාටුව සෝබර**
**අතුවල ගන කුහර කැලලැති**
**බෙලහීන නිරුවත් තුර**
**ලොවෙහි වරදට වැළපෙති**

**( *ඉංග්‍රීසි කිවියර* P. B. Shelly *ගේ* The Dirge *නමැති පැදිපෙළ ඇසුරෙනි*)**

♦ ***සේපාලිකා ජයසිංහ***
Middx **UK**

## කරුම පල

අවිගත්තවුන් නැහෙනා බව අවියෙන් ම
ඉතිහාසයේ දත හැක හුඟ තැනකින් ම
පල ලැබෙන් බවක් වපුරන විදියෙන් ම
සම්බුදු වදනෙ කියවී ඇත කවියෙන් ම

එක ජාතියක දොළදුක් ගිනි සනසන් න
තව ජාතියක් ඒ වෙනුවෙන් වනසන් න
යන අය අහිංසක මිනිසුන් බිලිගන් න
බිලිවෙයි හැරී ආවිට අවුලපු ගින් න

වෙන්නට ගිහින් ජාතියකට පබා කර
වීගෙන තිමිරකර අඳුරක් ළඟා කර
එම ජාතියට සතුරෙකු වී අනා දර
බොඳවිය කෙනෙක් දුටු සිහිනය සදා දර

කෙනෙකුට තනි තනිව පලදෙන සුළු කරුම
ජාතියකටත් පලදිය හැක ඒ ලෙසම
නසනට හෙළය සම්මාදම් වන සැවොම
කම්පල විඳිනු ඇත ඒ කරුමෙට නියම

දිවයින දහම් නිතරම දෙවියන් රකින
දෙදහස් වසක් රැකුනේ දහමෙහි බෙලෙන
කිසිවෙක් මෙතෙක් කල් එරටට වින කටින
නොලැබිය වරම මේ ලොව යහතින් සිටින

හෙළබිම ජයගන්න යුද අවි ගෙන පැමිණී
දඹදිව දකුණු දිග ජාතියකට පැරණී
අදවත් රටක් නැත්තේ ඔවුනට පවෙණී
කරුමය නිසයි ඒ අයගෙම ගිජු ලිහිණී

♦ ***මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම***
**Harrow UK**